සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 7 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 80 | S | I,II |
|---|---|---|---|---|

නම: ............................................ **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය** කාලය පැය 1 විනාඩි 30

- සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

01) නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.

1. මධ්‍ය සැකසුම් ඒකකයේ කොටසක් නොවන්නේ මේ අතරින් කුමක් ද?
   a. ප්‍රධාන මතකය　b. ගණිතමය හා තාර්කික ඒකකය
   c. පාලන ඒකකය　d. මතක රෙජිස්තර

2. ස්පන්දක වේගය (Clock Speed) මනිනු ලබන ඒකකය කුමක් ද?
   a. GB　b. Hz　c. Kmph　d. MB

3. දෙවන පරම්පරාවේ පරිගණක නිපදවීමට යොදාගත් ඉලෙක්ට්‍රොනික තාක්ෂණය කුමක් ද?
   a. අනුකලිත පරිපථ　b. ක්ෂුද්‍ර පරිපථ　c. ට්‍රාන්සිස්ටර්ස්　d. රික්තක නළ

4. පරිගණකයේ ක්‍රියාත්මක වේගය නැනෝ තත්පර වලින් මනිනු ලැබුයේ කුමන පරම්පරාවේ ද?
   a. පළමු පරම්පරාවේදී ය　b. දෙවන පරම්පරාවේ දී ය
   c. තෙවන පරම්පරාවේදී ය　d. සිව්වන පරම්පරාවේදී ය

5. පරිශීලකයාට පරිගණකය සමඟ සම්බන්ධ වීමට අතුරු මුහුණතක් ලබා දෙන්නේ කුමක් මගින් ද?
   a. පද්ධති ඒකකය මගිනි　b. මෙහෙයුම් පද්ධති මගිනි
   c. මධ්‍ය සැකසුම් ඒකකය මගිනි　d. යෙදුම් මෘදුකාංග මගිනි

6. පරිගණක වල භාවිතා වන මෙහෙයුම් පද්ධතියක් නොවන්නේ කුමක් ද?
   a. ඇපල් මැක් (Apple Mac)　b. උබුන්ටු (Ubuntu)
   c. ඇන්ඩ්‍රොයිඩ් (Android)　d. වින්ඩෝස් (Windows)

7. දත්ත ගබඩා කිරීමට යොදා ගන්නා ප්‍රධාන උපක්‍රමයක් වන්නේ මේ අතරින් කුමක් ද?
   a. ප්‍රකාශ මාධ්‍ය　b. ද්‍රව මාධ්‍ය　c. සංයුක්ත මාධ්‍ය　d. තැටි මාධ්‍ය

8. දත්ත ගබඩා කිරීමට යොදා ගන්නා චුම්භක මාධ්‍ය උපක්‍රමයක් වන්නේ කුමක් ද?
   a. සංයුක්ත තැටි　b. මතක කාඩ්පත්　c. පෑන් ධාවකය　d. දෘඪ තැටිය

09. ගොනුවක් ස්ථිරවම මැකීමට යොදා ගන්නා කෙටි මං යතුර (Shortcut Key) කුමක් ද?
   a. Ctrl + Delete　b. Delete　c. Shift + Enter　d. Shift + Delete

10. ගොනුවක් මත වම් මූසික බොත්තම එකවර දෙවතාවක් එබීමෙන් (Double Click),
   a. ගොනුවේ පිටපතක් සෑදේ　b. ගොනුව විවෘත වේ
   c. ගොනුව මැකී යයි　d. ගොනුව සුරැකේ

(ල. 3 x 10 = 30)

02) පහත ඡේදයේ හිස්තැන් වලට ගැළපෙන පිළිතුර වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න.

පරිගණකයේ ඇති අතින් ඇල්ලිය හැකි කොටස් පරිගණක ........................................ ලෙස හඳුන්වන අතර ඒවාගේ ආරක්ෂාවට විවිධ තර්ජන මතු විය හැක. මෙම තර්ජන මගින් පරිගණකය ආරක්ෂා කර ගැනීමට විවිධ උපක්‍රම යොදා ගත හැකිය. විදුලිය මගින් සිදුවන හානි වළක්වා ගැනීමට ........................................ මෙන්ම ........................................ භාවිතා කල හැකි අතර පරිගණකය ඇතුළත අධික ලෙස රත්වීම වළක්වා ගැනීමට ........................................ භාවිතා කල හැකිය. තවද පරිගණක විද්‍යාගාරය තෙතමනයෙන් තොරව පවත්වා ගැනීමෙන් ........................................ ඇතිවීම වළක්වා ගත හැකිය. (ල. 2 x 10 = 20)

(පරිගණක වෛරස, අනවරත ජව සැපයුම, සිසිළන පංකා, මෘදුකාංග, පරිපථ ලුහුවත්, දෘඩාංග, CCTV, විලායක)

03) යා කරන්න.

| | |
|---|---|
| 1. යෙදුම් මෘදුකාංගයකි | ජීවමිතික මුරපද |
| 2. ප්‍රවේශ පාලන උපක්‍රමයකි | ගිනි පවුර |
| 3. උපස්ථ පිටපත් තබා ගැනීමට යොදා ගනී | ට්‍රෝජන් අශ්වයා |
| 4. අනිෂ්ට මෘදුකාංගයකි | Ms Word |
| 5. අන්තර්ජාලයට පිවිසීමේ දී වැදගත් වේ | DVD |


(ල. 2 x 5 = 10)

04) පහත ප්‍රකාශන හරි නම් සත්‍ය ලෙසත් නැතිනම් අසත්‍ය ලෙසත් සදහන් කරන්න.

1. පළමු වදන් සැකසීමේ මෘදුකාංග Word Perfect වේ. ..........................
2. වදන් සැකසීමේ ලේඛනයකට වීඩියෝවක් ඇතුළත් කළ නොහැක. ..........................
3. i Work pages යනු වදන් සැකසීමේ මෘදුකාංගයක් නොවේ. ..........................
4. Ctrl යනු මෙහෙයුම් යතුරකි. ..........................
5. සාමාන්‍යයෙන් භාවිතා කරන යතුරු පුවරුව QWERTY ලෙස හදුන්වයි. ..........................
6. Enter යතුර මගින් වචන අතර ඉඩ තැබිය හැකිය. ..........................
7. Aple keynote යනු සමර්පණ මෘදුකාංගයකි ..........................
8. සමර්පණයක කදාවකට වගු ඇතුළත් කල නොහැක. ..........................
9. කදාවකින් තවත් කදාවකට මාරු වීමට කදා සංක්‍රාමණ විධි යොදා ගනී. ..........................
10. සමර්පණයක ඇති කදා සැගවිය හැකිය. ..........................

(ල. 2 x 10 = 20)

05) සෘජුකෝණාස්‍රයක පරිමිතිය සෙවීමට අදාළ පහත ගැලීම් සටහනේ a සිට e දක්වා හිස්තැන් දී ඇති ප්‍රකාශ යොදා ගනිමින් සම්පූර්ණ කරන්න.




පරිමිතිය = 2 (දිග + පළල)
දිග හා පළල ආදානය
නිමාව
පරිමිතිය ප්‍රතිදානය
ආරම්භය

(ල. 2 x 5 = 10)

06) කෙටි පිළිතුරු ලියන්න.

1. අන්තර්ජාලයෙන් ඔබට ලබා ගත හැකි සේවා 02 ක් ලියන්න.
   i. ................................................ ii. ................................................

2. අන්තර්ජාලයට පිවිසීමට යොදගෙත හැකි වෙබ් අතරික්සු 02 ක් ලියන්න.
   i. ................................................ ii. ................................................

3. විශ්වාසනීය වෙබ් අඩවියක් හඳුනාගත හැකි ආකාර 02 ක් ලියන්න.
   i. ........................................................................................................................
   ii. ........................................................................................................................


4. වීඩියෝ සම්මන්ත්‍රණයක් පැවැත්වීමට යොදා ගත හැකි මෘදුකාංග 02 ක් ලියන්න.
   i. ................................................ ii. ................................................

5. විද්‍යුත් තැපැල් ලිපිනයක ප්‍රධාන කොටස් 02 නම් කරන්න.
   i. ................................................ ii. ................................................

(ල. 2 x 5 = 10)

07) පහත වෙබ් පිටුව සැකසීමට අදාළ HTML කේත වරහන් තුළ දී ඇති කේත ඇසුරින් සම්පූර්ණ කරන්න.
(OL, TITLE, U, HEAD, HTML)

```
<HTML>
<..................>
<....................>Sri Lanka</..................>
</........................>
<BODY>
<H1><...........> WATERFALLS IN SRI LANKA
</............></H1>
<........... TYPE="1">
 <LI>BAMBARAKANDA</LI>
 <LI>DIYALUMA</LI>
 <LI>RAWANA ELLA</LI>
 </................>
 </BODY>
</...............>
```




(ල. 2 x 5 = 10)